## Abstract No 66

# පංචතන්ත්‍රයෙහි මිත්‍රභේදයේ එන චරිත තුළින් නූතන දේශපාලඥයන්ගේ ස්වරූපය විශද වන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

**ජේ.එම්.එන්.එම්. චාරංගා**
ශාස්ත්‍රවේදී විශේෂ දෙවන වසර- සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
nisharacharanga@gmail.com
**ආර්.එම්.ඩී.ආරියරත්න,**
ශාස්ත්‍රවේදී විශේෂ දෙවන වසර- ජනසන්නිවේදනය අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය
dinuar.uok@gmail.com

භාරතීයන්ගේ සාහිත්‍යය වනාහි එරට වැසියන්ගේ සභ්‍යත්වය මෙන් ම ආධ්‍යාත්මික වර්ධනය පිළිබිඹු කෙරෙන ප්‍රකාශන සමූහයකි. සංස්කෘත උපදේශ සාහිත්‍යය, වර්තමාන සමාජයේ බොහෝ අඩු ලුහුඬුකම් මඟ හරවාගෙන සාර්ථක ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය නොඅඩුව සපයයි. ඒ ගණයෙහිලා සැලකෙන පංචතන්ත්‍රය දඹදිව මහිලාරෝප්‍යනගරයේ අමරශක්ති රජුගේ බහුශක්ති, උග්‍රශක්ති, අනන්තශක්ති නම් පුතුන් තිදෙනාට නීතිශාස්ත්‍රය ඉගැන්වීම සඳහා විෂ්ණුශර්මන් නම් පඬිවරයෙකු විසින් ප්‍රණීත උසස් ග්‍රන්ථයකි. මිත්‍රභේදය, මිත්‍රසම්ප්‍රාප්තිය, කාකොලුකීයය, ලබ්ධප්‍රණාශය, අපරික්ෂිතකාරකය යන තන්ත්‍රපංචකය අතරින් මිත්‍රභේද නම් තන්ත්‍රයේ එන චරිත තුළින් නූතන දේශපාලඥයන්ගේ භූමිකාව හෙළිදරව් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණ වේ. මිත්‍රභේදයේ පිංගලක, දමනක, කරටක යන චරිත තුළින් නූතන දේශපාලඥයන්ගෙ ʻවංචනිකභාවය, ආත්ම විශ්වාසයෙන් තොරවීම, බුද්ධිහීනත්වය, ප්‍රකෝපකාරී හැසිරීම, ස්වකීය පැවැත්ම වෙනුවෙන් අන්‍යන් පීඩාවට පත්කිරීම ආදී වූ අයහපත් ගති පැවතුම් ද සංජීවක චරිතය තුළින් දේශපාලඥයන්ගේ ආත්මාර්ථකාමී නොමනා ක්‍රියාකලාපය නිසා පීඩනයට ලක් වන මහජනතාවගේ ස්වභාවය ද ප්‍රතීයමාන වේ. පංචතන්ත්‍රය හා ඒ ආශ්‍රිත ව රචනා වූ විචාර කෘති ද්විතීයික මූලාශ්‍රය ලෙස ගෙන මෙම අධ්‍යයනය සිදු කෙරේ. පංචතන්ත්‍රයෙහි මිත්‍රභේදයේ තිරිසන් සත්ත්ව චරිත තුළින් නූතන දේශපාලඥයන්ගේ ස්වරූපය නිරූපණය වන බැව් අවිවාදිත ය.

**ප්‍රමුඛපදඃ** නූතනදේශපාලඥයන්, පංචතන්ත්‍රය, මිත්‍රභේදය, විෂ්ණුශර්මන්